# තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව

ඉහත සඳහන් කොමිෂන් සභාවේ පහත දැක්වෙන තනතුරු සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. නීති නිලධාරී (තනතුරු 01)

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම සහ ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥයකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසරකට නොඅඩු කාලයක් නීතිඥයකු වශයෙන් සක්‍රිය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.

**වයස :** අවුරුදු 22 නොඅඩු හා 45 ට නොවැඩි

**වැටුප් ක්‍රමය :** MM 1-1 රු. 53,175 - 10x1,375 - 15x1,910 - 95,575

## 02. නීති සහකාර (තනතුරු 04)

**සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් නීතිය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

**වයස :** අවුරුදු 22 නොඅඩු හා 45 ට නොවැඩි

**වැටුප් ක්‍රමය :** MA 3 රු. 32,200 - 10x445 - 11x660 - 10x730 - 5x750 - 54,960

## 03. පෞද්ගලික සහකාර (තනතුරු 01)

**සුදුසුකම් :**

(අ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී

(i) සිංහල / දෙමළ

(ii) ගණිතය

(iii) ඉංග්‍රීසි භාෂාව

යන විෂයන් ඇතුළුව විෂයයන් හතර (04) කට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයන් හය (06) කින් සමත් වී තිබීම සහ

(ආ) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම සහ

(ඇ) තනතුරට විශේෂිත වෙනත් අවශ්‍ය සුදුසුකම් : පරිගණක හැකියාව පිළිබඳ මාස 06 කට නොඅඩු පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද සහතිකය.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු හා 45 නොවැඩි අය විය යුතුය.

**වැටුප් ක්‍රමය :** MA 1-1 රු. 27,910 - 10x300 - 7x350 - 4x495 - 20x660 - 48,540

## පොදු කොන්දේසි :

01. රාජ්‍ය හෝ සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල / කොමිෂන් සභාවල සේවය කරන අය තම අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.
02. තෝරාගනු ලබන අය 1956 අංක 22 රාජ්‍ය භාෂා ප්‍රතිපත්ති යටතේ පනවා ඇති නීති රීතිවලට යටත් වේ.
03. පත් කරනු ලබන දින සිට සේවක අර්ථ සාධක අරමුදලට දායක කරනු ලැබේ.
04. සියලු තනතුරු සඳහා රජය අනුමත දීමනා හිමි වේ.

අයදුම්කරුවන් සහතිකවල ඡායා පිටපත් සමග තමන් විසින් පිළියල කර ගන්නා ලද ජීව දත්ත අඩංගු අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2021.01.31 දිනට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට එවිය යුතුයි. කවරයේ වම් කෙළවරෙහි අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම් පිළිබඳ කොමිෂන් සභාව,**
**කාමර අංක 203-204,**
**ගොඩනැගිලි අංක 02,**
**බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාව, කොළඹ 07.**